SLGURU.LK

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

9 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 50 S

නම ..............................................

නාට්‍ය හා රංග කලාව

කාලය පැය දෙකයි

උපදෙස් ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න,
නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) නාට්‍ය පෙළ තුළ දක්නට ලැබෙන අංගයකි.
(1) රංග විධාන (2) වේෂ භූෂණ (3) සංගීතය (4) ආලෝක කරණය

(2) ලෝකයේ පවතින ස්වභාවය අනුව කරන ලද නාට්‍ය හඳුන්වනු ලබන්නේ,
(1) ලෝකෝත්තර නාට්‍ය නමිනි
(2) ලෝක ධර්මී නාට්‍ය නමිනි
(3) නාට්‍ය ධර්මී නාට්‍ය නමිනි
(4) අර්ධ ශෛලිගත නාට්‍ය නමිනි

(03) ලෝක ධර්මී නාට්‍යයකට නිදසුනකි
(1) මනමේ (2) පේමතෝ ජායතී සෝකෝ
(3) කැළණි පාලම (4) මධුර ජවනිකා

(04) කදා වළලු නාට්‍යයේ එන කච්ඡපුට හා සේරිවාණිජ අතර ඇති වන ගැටුම අයත් වන්නේ
(1) මිනිසා හා පරිසරය අතර ගැටුම
(2) මිනිසා හා ඔහුගේ මනස අතර ගැටුම
(3) මිනිසා හා අදෘශ්‍යමාන බලවේග අතර ගැටුම
(4) මිනිසා හා මිනිසා අතර ගැටුම

(05) කදා වළලු නාට්‍ය අයත් වන්නේ,
(1) නාට්‍ය ධර්මී ශෛලියට (2) ලෝක ධර්මී ශෛලියට
(3) ස්වභාවික ශෛලියට (4) තාත්වික ශෛලියට

(06) නාට්‍ය සංගීතය අයත් වන්නේ
(1) වාචික අභිනයට (2) ආහාර්ය අභිනයට (3) සාත්වික අභිනයට (4) ආංගික අභිනයට

(07) කදා වළලු නාට්‍යයේ එන වළලුකද අයත් වන්නේ,
(1) වේෂ භූෂණ වලට (2) පසුතල නිර්මාණ වලට
(2) රංග භාණ්ඩ වලට (4) ඇඳුම් පැළඳුම් වලට

(08) මේවා කදාවළලු නාට්‍යයේ එන චරිතවේ.
(1) සිටුදුව, මිත්තනිය, තොටියා, සේරිවාණිජ
(2) තොටියා, කච්ඡපුට, සේරිවාණිජ, අතීත වක්තෘ
(3) සිටුදුව, සේරිවාණිජ, සිටුතුමා, කච්ඡපුට
(4) සිටුදුව, මිත්තනිය, සේරිවාණිජ, කච්ඡපුට



SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(09) මේවා නාට්‍ය වල ඇතුලත් ආනුශංගික අංගවේ.
(1) ආලෝකය, වේෂභූෂණ, රංග භාණ්ඩ, සංගීතය
(2) වේෂ භූෂණ, රංග විධාන, සංගීතය, පසුතල නිර්මාණ
(3) වේෂ භූෂණ, සංගීතය, නාට්‍යෝපකරණ, සංවාද
(4) පසුතල නිර්මාණ, ආලෝකය, රංග භාණ්ඩ

(10) සමාරෝපය යනු,
(1) නාට්‍ය පිටපත නළුවා වෙත ගෙන යන මාධ්‍යයයි.
(2) රූපන ශිල්පියා තම පෞද්ගලිකත්වය අමතක කර වෙනත් ස්වරූපයක් ගැනීමයි,
(3) නළුවන් විසින් සිදු කරන පෙර පුහුණුවයි.
(4) නළුවන් වේදිකාව තුළ හැසිරීමයි.

(11) 'භූමිකාව' යනු
(1) නාට්‍යයක දක්නට ලැබෙන චරිතයි.
(2) චරිත අනුකරණය කිරිමයි.
(3) චරිතයක දැකිය හැකි විවිධ පැතිකඩයි.
(4) නාට්‍ය රඟ දක්වන වේදිකාවයි.

(12) නාට්‍යයක වේෂ භූෂණ යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
(1) අංග රචනයයි (2) වෙස් ගැන්වීමයි
(3) රඟපෑමට යොදාගන්නා භාණ්ඩයි (4) චරිත සඳහා යොදාගන්නා ඇඳුම් පැළඳුම්ය

(13) නාට්‍යයක ඇති සංවාද අයත් වන්නේ
(1) වාචික අභිනයටයි (2) සාත්වික අභිනයටයි
(3) ආහාර්ය අභිනයටයි (4) ආංගික අභිනයටයි

(14) ඇස් අතර පවතින සමබරතාවය වර්ධනය කිරිම සඳහා කරනු ලබන්නේ,
(1) සංවේදන අභ්‍යාස (2) දර්පණ අභ්‍යාස
(3) තාපන අභ්‍යාස (4) ශිථිලකරණ අභ්‍යාස

(15) කැඩපත් අභ්‍යාස තුළින් දියුණු කරගත හැකි කුසලතාවයක් වනනේ,
(1) පරිකල්පනයයි (2) සාමූහිකව කටයුතු කිරීමයි
(3) ක්ෂණිකව ක්‍රියාකිරීමයි (4) ඉවසීමයි

අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා පහත සඳහන් ප්‍රකාශ හරි නම් ( ✓ ) ලකුණ ද, වැරදි නම් ( x ) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

(16) කදා වළලු නාට්‍යයට පාදක කරගෙන ඇත්තේ සේරිවාණිජ ජාතකයයි. ( )
(17) අංග රචනය යනු රූපන ශිල්පියෙකුගේ ඇඳුම් පැළඳුම් සැකසීමයි. ( )
(18) නාට්‍ය පෙළ යනුවෙන් හඳුන්වන්නේ නාට්‍ය පිටපතයි. ( )
(19) චරිතයක භූමිකා කිපයක් තිබේ. ( )
(20) නාට්‍ය සඳහා පසුතල නිර්මාණ අත්‍යවශ්‍ය වේ. ( )

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

● **පළමු වන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න.**

(01) i කදා වළලු නාට්‍ය සඳහා පාදක කරගත් ජාතක කථාව කුමක්ද? (ල. 2)

ii මෙම නාට්‍ය අයත් වන ශෛලිය නම් කරන්න. (ල. 2)

iii කදා වළලු නාට්‍යයේ එන චරිත 02ක් නම් කරන්න. (ල. 2)

iv මෙම නාට්‍ය සඳහා යොදා ගන්නා රංග භාණ්ඩ 02ක් ලියන්න. (ල. 2)

v මෙම නාට්‍ය අධ්‍යක්ෂවරයා නම් කර ඔහුගේ වෙනත් නාට්‍ය නිර්මාණයක් ලියා දක්වන්න. (ල. 2)

(02) i වේදිකා නාට්‍යයක දැකිය හැකි ආනුශංගික අංග 02ක් නම් කරන්න. (ල. 2)

iiආනුශංගික අංග මඟින් නාට්‍යයකට ලැබෙන ප්‍රයෝජන 03ක් ලියන්න. (ල. 3)

iiiආනුශංගික අංග සකස් කිරීමේදී සැලකිය යුතු කරුණු මොනවාද? (ල. 5)

(03) i ප්‍රධාන නාට්‍ය රංග ශෛලි 02 නම් කරන්න. (ල. 2)

iiඒ එක් එක් රංග ශෛලියන්ට අයත් නාට්‍ය 02 බැගින් ලියන්න. (ල. 4)

iiiඉන් එක් රංග ශෛලියක් පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ල. 4)

(04) i දර්පණ අභ්‍යාස සඳහා භාවිතා කරන වෙනත් නමක් ලියන්න. (ල. 2)

ii දර්පණ අභ්‍යාස වල යෙදීමෙන් නළුවාට අත්වන ප්‍රයෝජන 03ක් ලියන්න. (ල. 3)

iiiපංති කාමරයේ දී ඔබ දර්පණ අභ්‍යාසයේ නිරත වූ අයුරු කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

(05) පහත සඳහන් කථා තේමාව පාදක කර ගනිමින් නාට්‍යයකට සුදුසු පෙළක් නිර්මාණය කරන්න.

ඉගෙනීමට මෙන්ම ක්‍රීඩාවටද එකසේ දස්කම් දක්වන චමත් ගැමුණු නිවාසයේ නිවාස නායකයායි. මෙවර නිවාස කුටි නිර්මාණයේ ප්‍රථමස්ථානය ලබා ගැනීමේ දැඩි බලාපොරොත්තුවෙන් කටයුතු කරන ඔහු නිවාස කුටියේ අලංකරණය සඳහා කිතුල් මල් සොයා ගැනීමට සිතා අවශ්‍ය උපකරණද රැගෙන 09 ශ්‍රේණියේ දරුවන් සමඟ ගියේ කිතුල් මල් කැපීම සඳහාය.කිතුල් ගස මුලට ගිය ඔහු විමසිලිමත්ව වට පිට බලද්දී...................

1) සංවාද හා රංග විධාන සහිත පෙළ නිර්මාණයට (ල. 3)

2) චරිත අතර ගැටුමක් ඇති වන අයුරින් පෙළ සකස් කිරීම (ල. 3)

3) දෙගිඩියාව, කුතුහලය හා උත්ප්‍රාසය සහිතව නාට්‍යෝචිත අවස්ථා නිර්මාණයට (ල. 4)

SLGURU.LK



For Educational Purpose Only

“Live as if you were to die tomorrow. Learn as if you were to live forever.” — Mahatma Gandhi

Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
පළමු වාර පරීක්ෂණය - 2019
9 ශ්‍රේණිය
නාට්‍ය හා රංග කලාව පිළිතුරු පත්‍රය

# I පත්‍රය

| | | | |
|---|---|---|---|
| 01 - 01 | 06 - 02 | 11 - 03 | 16 - ✓ |
| 02 - 02 | 07 - 03 | 12 - 04 | 17 - x |
| 03 - 03 | 08 - 04 | 13 - 01 | 18 - ✓ |
| 04 - 04 | 09 - 01 | 14 - 02 | 19 - ✓ |
| 05 - 01 | 10 - 02 | 15 - 03 | 20 - x |

# II පත්‍රය

01) i සේරිවාණිජ ජාතක කථාව (ල.2)
ii නාට්‍ය ධර්මී ශෛලිය (ල.2)
iii සිටුදුව, මිත්තනිය, සේරිවාණිජ, කච්ඡපුට (ල.2)
iv තලිය, වළලු කද (ල.2)
v එදිරිවීර සරච්චන්ද්‍ර මහතා, මනමේ, සිංහබාහු, වෙස්සන්තර, පේමතෝ ජායතී සොකෝ, එලොව ගිහින් මෙලොව ආවා........ ආදී සරච්චන්ද්‍ර මහතාගේ නාට්‍යක් නම් කිරීමට (ල.2)

02) i ආලෝකය, සංගීතය, වේෂභූෂණ, පසුතල නිර්මාණ, රංග භාණ්ඩ, අංග රචනය.........02 ක් නම් කිරීමට (ල.2)
ii 1. නාට්‍යයේ අර්ථය ප්‍රේක්ෂයා වෙත ගෙනයාම පහසුවීම
2. රංග වින්‍යාසයට හා නාට්‍ය ගලායාමට පහසුවීම
3. නාට්‍ය අලංකාර වීම
4. චරිත වල බාහිර ලක්ෂණ ඉස්මතු කිරීමට
5. කථා තේමාව අර්ථවත් කිරීම...... ආදී කරුණු 03 ක් සඳහා (ල.3)
iii ★ නාට්‍යයේ ශෛලිය පිළිබඳව සැලකිලිමත් වීම
★ නාට්‍යයෙන් කියවෙන කාලයට, දේශයට අනුව සකස් කිරීම
★ අඩු වියදම් සහිත වීම
★ පරිහරණයේ පහසුව
★ සැහැල්ලු ද්‍රව්‍ය යොදා ගැනීම ආදී කරුණු 03ක්වත් විස්තර කර ඇත්නම් (ල.5)

(03) i ලෝක ධර්මී ශෛලිය , නාට්‍ය ධර්මී ශෛලිය (ල.2)
ii ලෝක ධර්මී ශෛලිය - කැළණි පාලම, මෝදර මෝල, තට්ටු ගෙවල් අහසින් වැටුණු මිනිස්සු (ල.2)
නාට්‍ය ධර්මී ශෛලිය - මනමේ, සිංහබාහු, පේමතෝ ජායතී සෝකෝ දික්තල කාලගෝල ආදී (ල.2)
iii

| ලෝක ධර්මී ශෛලිය | නාට්‍ය ධර්මී ශෛලිය |
|---|---|
| ස්වාභාවික සංවාද | රිද්මයානුකූල සංවාද හා ගමන් තාල |
| ස්වාභාවික ගමන හා ඇඳුම් පැළඳුම් | අතිශයෝක්ති වේෂ භූෂණ හා රංග භාණ්ඩ |
| ස්වාභාවික ආනුශංගික අංග | පසුතල නිර්මාණ අවම වීම |
| පසුතල බහුල වීම | |

ආදී කරුණු විස්තර කර ඇත්නම් (ල.04)

(04) i කැඩපත් අභ්‍යාස (ල.2)
ii 1. ක්ෂණික ක්‍රියා කිරීමේ හැකියාව වර්ධනය
2. අනුකරණ කුසලතාවය වර්ධනය
3. නිර්මාණශිලිත්වය වර්ධනය වීම
4. අක්ෂි සම්බන්ධතාවය වර්ධනය වීම ආදී 03ක් ලියා ඇත්නම් (ල.3)
iii සිසුන් සමාන්තර පේළි දෙකක සිටුවා මුහුණින් මුහුණ බැලීමට සලස්වා එක් ශිෂ්‍ය කණ්ඩායමක් කැඩපත් ලෙසද අනෙක් කණ්ඩායම සිසුන් ලෙසද නම්කර විවිධ ඉරියව් ඉදිරිපත් කිරීම යන අදහස විස්තර කර ඇත්නම් (ල.5)

(05) i සංවාද රංග විධාන සහිත පෙළ නිර්මාණයට (ල.3)
ii චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් පෙළ සකස් කිරීම (ල.3)
iii දෙගිඩියාව, කුතුහලය හා උත්ප්‍රාසය සහිතව නාට්‍යෝචිත අවස්ථා නිර්මාණයට (ල.4)


SLGURU.LK
For Educational Purpose Only